සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 2025
## Second Term Test - 2025

| 9 ශ්‍රේණිය | නාට්‍ය හා රංග කලාව | කාලය පැය 02 යි |
|---|---|---|

නම/ විභාග අංකය:

## I - කොටස

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **පහත දී ඇති ගද්‍ය හා පද්‍ය කොටස් ඇසුරින් 01 - 05 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A දෙමාපියන් දූ දරුවන් - නාමෙට පින් පමුණුවන්න
මලගිය ඇත්තන් වෙනුවෙන් - පිනට මුකුත් මට ලැබෙන්න

B විචිත්‍ර වර්ණෝපශෝභිත වූ මෙම මණ්ඩප ද්වාරයෙහි මිනිසුන් ඇත.

C අතට වළලු ද පයට ගිගිරි ද

D A - මට දවල් වෙනකම් බුදියන්ඩ ඕනෑ
ලා ගනී කිඳුරගන සොබනා
B - එසේ ය මහරජතුමනි.

E ඉතිං සැනහෙන්න - හොඳින් පුළුවන්නේ
දෙමව්පියෝ දෙන්න - ඇවිත් අර ඉන්නේ

01. මෙහි ජනකතා ඇසුරෙන් නිර්මාණය කළ නාට්‍යක් හා සම්බන්ධ වන්නේ,
(i) B ය. (ii) C ය. (iii) A ය. (iv) D ය.

02. ජාතක කතා ඇසුරින් නිර්මාණය වූ නාට්‍යයක් හා සම්බන්ධ වන්නේ,
(i) A ය. (ii) B ය. (iii) C ය. (iv) D ය.

03. බෞද්ධ පූජා කර්ම වලට හා සම්බන්ධ වන්නේ,
(i) A ය. (ii) E ය. (iii) B ය. (iv) D ය.

04. දයානන්ද ගුණවර්ධන මහතා විසින් රචිත නාට්‍යයක ගීතයක් හා සම්බන්ධ වන්නේ,
(i) B ය. (ii) C ය. (iii) D ය. (iv) E ය.

05. මහා වංශයේ එන කථාවක් පදනම් කරගෙන නිර්මාණය වූ නාට්‍යයක් හා සම්බන්ධ වන්නේ,
(i) B ය. (ii) C ය. (iii) D ය. (iv) E ය.

- **6 - 10 දක්වා ප්‍රශ්නවලට නොගැලපෙන පිළිතුර තෝරන්න.**

06. නාට්‍යයක පසුතල නිර්මාණ,
(i) පිටපත අධ්‍යනය කර නිර්මාණය කළ යුතුය.
(ii) වේදිකාවේ ඉඩකඩ පිළිබඳ සැලකිලිමත් විය යුතුය..
(iii) ආකර්ෂණීය පෙනුමක් යුක්තව නිර්මාණය කළ යුතුය.
(iv) සංකේතාත්මක ව මිනිස් සිරුර මගින් ද පෙන්විය හැක.

07. නාට්‍යයක අංග රචනයේදී,
(i) කාලය යුගය පිළිබඳ සැලකිලිමත් විය යුතුය.
(ii) නළුවාට ඇති අසාත්මිකතා සාකච්ඡා නොකළ යුතුය.
(iii) අඩු වියදමකින් උපරිම ප්‍රයෝජන ගත යුතුය.
(iv) ප්‍රේක්ෂකයාට චරිත හඳුනා ගැනීමට හැකි විය යුතුය.

08. නාට්‍යෝපකරණ නිර්මාණයේදී,
   (i) නාට්‍ය අභ්‍යන්තරය හා සම්බන්ධ විය යුතුය.
   (ii) සැහැල්ලු බව හා සරල බව පිළිබඳ සැලකිලිමත් විය යුතුය.
   (iii) නාට්‍යයකදී යම් අවස්ථාවකදී භාවිතා කළ යුතුය.
   (iv) රංග ශෛලිය පිළිබඳ සැලකිලිමත් නොවිය යුතුය.

09. වේෂ භූෂණ නිර්මාණයේදී,
   (i) පහසුවෙන් ගබඩා කළ හැකි විය යුතුය.
   (ii) නළුවාට පහසුවෙන් දරා සිටීමට හැකි විය යුතුය.
   (iii) නාට්‍ය නිර්මාණයට පාදක යුගය පිළිබඳ අවධානය යොමු කළ යුතුය.
   (iv) නළුවාගේ බාහිර හා අභ්‍යන්තර සමාරෝපයට උපකාරී විය යුතුය.

10. නාට්‍යයක සංවාද හා සම්බන්ධ වන්නේ,
   (i) නාට්‍ය ගලා යැමට ඉතා වැදගත් වේ.
   (ii) ලෝක ධර්මී සංවාද එදිනෙදා භාෂාවට සමීප වේ.
   (iii) ඒවායේ විරාම, නැවතීම, ප්‍රශ්නාර්ථ වැනි ලක්ෂණ දක්නට ලැබේ.
   (iv) සංවාද ඒ ඒ ශෛලිය අනුව වෙනස් නොවේ.

- **11 - 15 දක්වා ප්‍රශ්නවලට පහත වගුව ඇසුරින් පිළිතුරු සපයන්න.**

| A | B | C | D |
|---|---|---|---|
| මධුර ජවනිකා<br>කාමරේ පොරේ<br>ජීවන වංචා<br>බක්මහ අකුණ | මූදු පුත්තු<br>දේවතා එළි<br>දෑස නිසා<br>ලියතඹරා | මෝදර මෝල<br>හිරුනැතිලොව<br>මේස<br>වෙරි උයන | මනමේ<br>වෙල්ලවැහුං<br>මහාසාර<br>සිංහබාහු |

11. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ නාට්‍ය ඇතුළත් අක්ෂර වන්නේ,
   (i) A ය. (ii) B ය. (iii) C ය. (iv) D ය.

12. දයානන්ද ගුණවර්ධනයන්ගේ නාට්‍ය ඇතුළත් අක්ෂරය වන්නේ,
   (i) A ය. (ii) B ය. (iii) C ය. (iv) D ය.

13. රංජිත් ධර්මකීර්ති මහතාගේ නාට්‍ය ඇතුළත් අක්ෂරය වන්නේ,
   (i) A ය. (ii) B ය. (iii) C ය. (iv) D ය.

14. ගුණසේන ගලප්පත්ති මහතාගේ නාට්‍ය ඇතුළත් අක්ෂරය වන්නේ,
   (i) A ය. (ii) B ය. (iii) C ය. (iv) D ය.

15. සිංහල නාට්‍ය කලාවේ සංදිස්ථානය සනිටුහන් කරන නාට්‍ය ඇතුළත් වරණය වන්නේ,
   (i) A ය. (ii) B ය. (iii) C ය. (iv) D ය.

- **16 - 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.**

16. තොප්පි වෙළෙන්දා, පුංචි අපට දැන් තේරෙයි වැනි ළමා නාට්‍ය ....................................................... විසින් නිර්මාණය කරන ලදී.

17. ....................................................... සිංහබාහු නාට්‍යයේ සිංහයාගේ චරිතටය රංගන දායකත්වය ලබා දී ඇත.

18. 1956 මනමේ ප්‍රධාන චරිතය වූ මනමේ කුමරිගේ චරිතය රඟ පෑවේ ....................................................... යි.

19. සුප්පා දේවියගේ චරිතය නිරූපණය කළේ ....................................................... ය.

20. ගුණසේන ගලප්පත්තිගේ මූදු පුත්තු නාට්‍යයේ තේගිරිස්ගේ චරිතය සඳහා ....................................................... රංගන දායකත්වය ලබා දී ඇත.

( සිරිල් වික්‍රමගේ, මාලනී රණසිංහ, මාක් ඇන්ටනී ප්‍රනාන්දු, සෝමලතා සුබසිංහ, එඩ්මන් විජේසිංහ, ට්‍රිලීෂියා ගුණවර්ධන )

(ලකුණු 1 x 20 = 20)

## II - කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 03 ට පිළිතුරු සපයන්න.**

01 A - ''මේ ළමයාගේ ආසාවට මං පෙන්න පෙන්නා හිටියා සිටු දේවිය. කසී රටෙන් ගෙනාපු හරි අපූරු වළලු වගයක්.

B - (තරහින් මෙන්) මොනවාට ද ඔය කදා වළලු ? මෙන්න මෙහෙ ඇතුළට යන්න.''

(1) ඉහත සංවාද කොටස ඇතුළත් නාට්‍ය හා එහි අධ්‍යක්ෂවරයා නම් කරන්න. (ලකුණු 02)

(2) මෙම නාට්‍ය සඳහා පාදක කරගත් කතා පුවත ඇතුළත් ග්‍රන්ථය හා එහි ශෛලිය ලියන්න. (ලකුණු 02)

(3) A හා B චරිත පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 02)

(4) මෙම අවස්ථාවේ දී වේදිකාවේ දක්නට ලැබෙන චරිත සංඛ්‍යාව නම් කර රංග විධානයක් ලියන්න. (ලකුණු 02)

(5) මෙම නාට්‍යයෙන් ලබා දෙන ආදර්ශයක් ලියන්න. (ලකුණු 02)

02 (1) බෞද්ධ පූජා කර්ම 02 ක් නම් කරන්න. (ලකුණු 02)

(2) එම පූජා කර්ම වල දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ 03 ක් ලියන්න. (ලකුණු 03)

(3) ඔබ කැමැති එක් පූජා කර්මයක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

03 (1) වේදිකා නාට්‍යයක දැකිය හැකි ආනුෂාංගික අංග 02 ක් නම් කරන්න. (ලකුණු 02)

(2) ආනුෂාංගික අංග මගින් නාට්‍යයට ලැබෙන ප්‍රයෝජන 03 ක් ලියන්න. (ලකුණු 03)

(3) ආනුෂාංගික අංග සකස් කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු මොනවාදැයි විස්තර කරන්න. (ලකුණු 05)

04 (1) නාට්‍ය ශෛලීන් කීයද? ඒ මොනවාද? (ලකුණු 02)

(2) එම නාට්‍ය ශෛලීන් සඳහා උදාහරණ 02 බැගින් ලියන්න. (ලකුණු 04)

(3) ඔබ කැමැති එක් නාට්‍ය ශෛලියක් විස්තර කරන්න. (ලකුණු 04)

05 විශ්ව පාසලේ දක්ෂ ශිෂ්‍යයෙකි. එසේම පාසලේ විනය නීති කඩ නොකරන ශිෂ්‍යයෙකි. දිනක් ඉගැන්වීම සිදුකරන අවස්ථාවේ දී පන්ති කාමරයේ නොසිටි සිසුන් පිරිසක් විදුහල්පති වෙත ඉදිරිපත් කරනු ලබයි. විශ්ව ද ඒ අතර වේ.

මෙම කතාව අභිමත පරිදි ඉදිරියට ගෙන යමින් සංවාද, රංග විධාන, නාට්‍යෝචිත අවස්ථා සහිත නාට්‍ය පිටපතක් නිර්මාණය කරන්න. (ලකුණු 10)

**9 ශ්‍රේණිය** | **දෙවන වාර පරීක්ෂණය 2025** | **නාට්‍ය හා රංග කලාව**

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | iii | 02 | iii | 03 | ii | 04 | iv | 05 | iii | 06 | iii | 07 | ii | 08 | iv |
| 09 | i | 10 | iv | 11 | iv | 12 | i | 13 | iii | 14 | ii | 15 | iv | | |

16 සෝමලතා සුබසිංහ
17 මාක් ඇන්ටනී
18 ත්‍රිලිෂියා ගුණවර්ධන
19 මාලකි රණසිංහ
20 සිරිල් වික්‍රමගේ (ලකුණු 20)

## II - කොටස

01 (i) ♦ කදා වළලු ♦ මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර

(ii) ♦ පන්සිය පනස් ජාතකය ♦ නාට්‍ය ධර්මී ශෛලිය

(iii) A සේරිවැනිජ B මිත්තනිය

(iv) 03 (තරඟින් මෙන්)

(v) දැඩි තණ්හාව විනාශයට මුල (ඒ හා සමාන පිළිතුරු ඇත්නම් ලකුණු ලබා දෙන්න. ) (ල. 2 x 5 = 10)

02 (i) දොරකඩ අස්න, ආලවක දමනය, මිලින්ද ප්‍රශ්නය, ආසන දෙකේ බණ (ල. 02)

(ii) අනුකරණය, සමාරෝපය, සංවාද භාවිතය, රංග භූමිය, ආරූඪ වීම. (ල. 03)

(iii) නිවැරදි පිළිතුර ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 05)

03 (i) අංග රචනය, විදුලි ආලෝකය, සංගීතය, පසුතල නිර්මාණය, නාට්‍යෝපකරණය (ල. 02)

(ii) නිවැරදි පිළිතුර ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 03)

(iii)
- ♦ නාට්‍යයට උචිත බව ♦ ප්‍රවාහනයට පහසු වීම.
- ♦ නළු කාර්යයට බාධාවක් නොවීම. ♦ අඩු මුදලකින් නිර්මාණය කිරීම.
- ♦ කල් පැවැත්ම ආදී නිවැරදි පිළිතුරු ලියා විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 05)

04 (i) 2 යි.
1. ලෝක ධර්මී නාට්‍ය ශෛලිය
2. නාට්‍ය ධර්මී නාට්‍ය ශෛලිය (ල. 02)

(ii) ලෝක ධර්මී හා නාට්‍ය ධර්මී නාට්‍ය නම්කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 04)

(iii) පිළිතුර නිවැරදි නම් ලකුණු ලබා දෙන්න. (ල. 04)

05 සංවාද, රංග විධාන, චරිත, නාට්‍යෝචිත අවස්ථා ඉස්මතු කරමින් පෙළ රචනා කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

9 ශ්‍රේණිය

# නාට්‍ය හා රංග කලාව

## ප්‍රායෝගික පරීක්ෂණය

01 නිර්දිෂ්ඨ නාට්‍ය පෙළ ඇසුරින් පුහුණු වී පැමිණි සංවාදය ඉදිරිපත් කිරීම (කදා වළලු) (ල. 05)

02 ගුරුවරයා විසින් නියම කරන ලද සංවාද ඉදිරිපත් කිරීම. (ල. 05)

03 නාට්‍ය ගීතය (ල. 15)

04 කතන්දරයක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කිරීම (ල. 10)

05 පහත සඳහන් මාතෘකා අතරින් අහඹු ලෙස තෝරාගන්නා ලද මාතෘකාවකට අනුව ක්ෂණික නිරූපනය ඉදිරිපත් කිරීම. (ල. 15)

(i) පාසලට ප්‍රමාද වී පැමිණි සිසුවෙක්

(ii) අවුරුදු 10 කට පසු සිටු දියණියට කච්චපුට හමු වීම

(iii) පංතියේ සිසුවෙකු හදිසියේ අසනීප වී

(iv) ලබු කිරිබත් කෑමට කැන්ද කොළ කඩාගෙන ආ හාවා

(v) පංතියට නයෙකු පැමිණ